# බුද්ධෝත්පාද
# ක්ෂණ සම්පත්තිය


සම්පාදනය

ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය සාසනධජ

මහා කම්මට්ඨානාචාර්ය

**අති පූජ්‍ය නා උයනේ අරියධම්ම ස්ථවිර**


උතුම් ධර්මදානයක් ලෙස පිළිගන්වන්නේ බැතියෙනි.

**“සබ්බ දානං ධම්ම දානං ජිනාති”**

(සියළු දානයන් පරදවා ධර්ම දානය ජය ගනී.)

ධර්ම දානය

වෛද්‍ය ජනක වෛද්‍යසේකර මහත්මයා සහ

එම මහත්මනී


**ප්‍රථම මුද්‍රණය 2012**



© Lithira ලිතිර Printing Industries 20114 16



306, ඇඹුල්දෙණිය හංදිය, නුගේගොඩ.

0714521990/0112835583/0112177088

lithira2008@yahoo.com




''ධම්මෙන නෙන මතිසිද්ධ මුදාචිතෙන

බුද්ධා දි වත්ථු ගත ධම්ම බලෙන සද්ධිං

ථෙරාසභො අරියධම්ම යතින්ද නාථො

දීඝායුකො භවතු සාධු සමිද්ධ චිත්තො''

දැහැමෙන්, සෙමෙන් රැස් කළ කුසල් බලයෙන්

හා බුද්ධාදිරත්නයන් කෙරෙහි චිත්ත ප්‍රසාදයෙන්

ථෙරාසභො අරියධම්ම යතීන්ද්‍රයාණන් වහන්සේ

ලබත්වා! දිගාසිරි

සාධු ! සාධු ! සාධු !

මහෝපාධ්‍ය ත්‍රිපිටක වාගීෂ්වරාචාර්‍ය්‍ය,

ශාසනධජ නම් ගෞරව නාමයෙන් පිදුම් ලද

ශ්‍රී කළ්‍යාණී යෝග්‍රාශ්‍රම සංස්ථා ප්‍රධාන අනුශාසක

ධූරන්දර, මහා කම්මට්ඨානාචාර්‍ය්‍ය අති පූජනීය

**නා උයනේ අරියධම්ම මහා නාහිමි සමිඳුන්ට**

අපගේ උත්තමාංග නමස්කාරය වේවා!

මෙම දහම් පුස්ථකය නාහිමිපාණන් වහන්සේට

ගුරු පූජාවක් වේවා!

සාධු ! සාධු ! සාධු !

## පෙර වදන

**නමෝ තස්ස භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

**“නිබ්බානං පරමං සුඛං”**

බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා විසින් මහා කල්ප අසංඛ්‍ය ගණන් අති දීර්ඝ කාලාන්තරයක් තිස්සේ පාරමී ශීර්ෂයෙන් බෝධිපාක්ෂික ධර්මයන් සපුරන ලදුව අත්කර ගන්නා ලද පරම ශ්‍රේෂ්ඨතම සැපය ශාන්ති ලක්ෂණ නිර්වාණ සැපය යයි සර්වඥයන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ ආත්ම ප්‍රත්‍යක්ෂයෙනි.

ශාන්ති ලක්ෂණ නිර්වාණ සම්පත්තිය සාක්ෂාත් කරගැනීමේ මාර්ගෝපදේශනය ලැබෙන්නේ සමසක් සම්බුද්ධ සර්වඥ ශාසනයෙන් පමණකි. එම මාර්ගෝපදේශනය අනුගමනය කළහැකි වනුයේ නුවණැති මනුෂ්‍ය ආත්මභාවයකදී පමණකි. ප්‍රතිරූපදේශ වාසයත් සත් පුරුෂ කල්‍යාණ මිත්‍ර උපසේවණයත් සද්ධර්ම ශ්‍රවණයත්

යෝනිසෝමනසිකාරයත්, නිර්වාණ මාර්ගෝපදේශන අනුගමනය පිණිස හේතුවන ප්‍රධානතම ප්‍රත්‍යයෝපනිශ්‍රයකි. එය අති දුර්ලභ ක්‍ෂණ සම්පත්තියකි.

චින්තාමාණික්‍යයක් ලත් දුගියෙක් වේ නම් ඒ අනර්ඝ වස්තුව ජීවිතය මෙන් ආරක්‍ෂා කර ගත හොත් ඔහු සක්විති රජ කෙනෙකු මෙන් වාසනා වන්තයෙකි. නොඑසේ නම් ඔහු බරණැස විසූ මහධන සිටු පුත්‍රයා සේ අනිත පරිහානියට පත්වීම අනිවාර්‍යයිය.

වත්මන් කාලයේ බුදුසසුන අඩක් ගෙවී ඇතත් ක්‍ෂණ සම්පත්තිය සියලු ආකාරයෙන් නෛර්යාණිකව පවත්නේමය. එසේ හෙයින් කුශලච්ඡන්දය ඇති නැණවතුන් විසින් අප්‍රමාදව සම්බුද්ධ ශාසනයෙන් ශාන්ත නිවන් සුව විඳිනු පිණිස නිර්වාණ මාර්ගයෙහි සතතයෙන් යෙදතේවා.

“සුඛො බුද්ධානං උප්පනිද්‍ර” යනාදී බුද්ධ වචනය මාතෘකාවෙන් මා විසින් පැවැත් වූ බුද්ධ ගුණ මාත්‍රයක් දැක්වෙන කෙටි බණ දෙසුම මෙසේ දහම් පොතක් වශයෙන් මුද්‍රණය කරවා ධර්ම දානය වශයෙන් පිරිනමනුයේ පින්වත් ජනක වෛද්‍යසේකර දොස්තර



මහත්මයා සහ පින්වත් එම මහත්මනීද විසින් ඉමහත් බුද්ධාලාම්බණ ප්‍රීතියෙනි.

මේ සඳහා කරුණාවෙන් උපදෙස් දෙමින් අනුග්‍රහ කළ පූජ්‍ය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමීන් වහන්සේටත්, පින්වත් ජනක වෛද්‍යසේකර දොස්තර මහත්මයා සහ එම මහත්මනීටත්, ඒ දෙදෙනාගේ ආදරණීය පුතණුවන්ටත්, අනුමෝදන් වන ශ්‍රද්ධා බුද්ධි සම්පන්න සියලු දෙනාටත් බුද්ධාදී රත්නසුත්‍රයේ අසීමිත සුවිසි මහා ගුණානුභාව බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් ආයුරාරෝග්‍යා දී සැපවිහරණයත් දෙලොව සුව සෙතත් ශාන්ත නිවන් සුවයත් සුවසේ සාක්‍ෂාත් වේවා.

**“සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා”**

මෙයට, මෙතැති,

*නාඋයනේ අරියධම්ම ස්වාමි*

නාඋයන ආරණ්‍ය සේනාසනය,

පන්සියගම.





“සුඛෝ බුද්ධානං උප්පාදෝ”

**නමෝ තස්ස භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස ///**

**සුඛෝ බුද්ධානං උප්පාදෝ - සුඛා සද්ධම්ම දේශණා**

**සුඛා සංඝස්ස සාමාගගී - සමග්ගානං තපො සුඛෝති**

ශ්‍රද්ධාවන්ත පින්වත්නි,

තුන්ලෝකාග්‍ර වු සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් දේශණා කරන ලද විශිෂ්ඨ සම්පත් 4 ක් මේ ගාථාවේ සඳහන් වෙනවා.

“සුඛෝ බුද්ධානං උප්පාදෝ” - සර්වඥ සම්මා සම්බුදු රජාණන් වහන්සේලාගේ පහළවීම දෙවියන් මනුෂ්‍යයන් සහිත සමස්ත සත්වයන්ට ලොවී ලොව්තුරා හිත සුව පිණිස පවතිනවා.

“සුඛා සද්ධම්ම දේසණා” - සියලු සර්වඥයන් වහන්සේ විසින් දේශණා කරන ලද සුවිශුද්ධ වු

ශ්‍රී සද්ධර්මය දේශණා කිරිම දෙවියන් මනුෂ්‍යයන් සහිත සමස්ත ලෝකයාට ලොවී ලොව්තුරා හිත සුව පිණිස පවතිනවා.

"සුඛා සංඝස්ස සාමාග්ගී" - සියලු සර්වඥයන් වහන්සේලාගේ ශ්‍රී සද්ධර්මයට අනුව සසුන් පිළිවෙත් පිරීමෙහි ශ්‍රාවක සංඝ රත්නය සාමාග්‍රීතාවයට පත්වීම දෙවියන් මනුෂ්‍යයන් සහිත සමස්ත සත්වයන්ටම ලොවී ලොව්තුරා හිත සුව පිණිස පවතිනවා.

සමගි වූ ගිහි පැවිදි බෞද්ධයන්ගේ ඒකාත්මිකතාව දෙවියන් මනුෂ්‍යයන් සහිත සමස්ත සත්වයන්ටම ලොවී ලොව්තුරා හිත සුව පිණිස පවතිනවා කියන එක මේ ගාථාවේ කෙටි තේරුමයි.

බුදුරජාණන් වහන්සේ කෙනෙක් ලොව පහළ වෙනු ලබන්නේ කල්ප කෝටි සත සහශ්‍ර ගණනාවකින් පසුවයි.

මීට සාරා සංඛ්‍යා කල්ප ලක්ෂයකට පෙර තණ්හන්කර, සරණංකර, මේධංකර, දීපංකර නම් වූ බුදුරජාණන් වහන්සේලා සතර නම එක කල්පයක පහළ වුනා. ඒ බුදුරජාණන් වහන්සේලාගෙන් පසුව මහා කල්ප



අසංඛ්‍යයක්ම බුදු රජාණන් වහන්සේලා නැතිව හිස්ව ගෙවුනා. මහා කල්ප අසංඛයකින් පසුව එකම කල්පයක පහළ වුණු එකම සර්වඥයන් වහන්සේ තමයි කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ.

එම කොණ්ඩඤ්ඤ සර්වඥයන් වහන්සේගෙන් පස්සෙ මහා කල්ප අසංඛ්‍යයක්ම බුදුවරයන් වහන්සේලා නැතිව අන්ධකාරව පහු වුණා. ඉන් අනතුරුව මංගල, සුමන, රේවත, සෝභිත කියන බුදුවරයන් වහන්සේලා සතර නම එක කල්පයක පහළවුණා. සෝභිත සර්වඥයන් වහන්සේගෙන් පසුව මහා කල්ප අසංඛ්‍යයක්ම බුදු රජාණන් වහන්සේලා නැතිව හිස්ව ගෙවුනා ඊට පස්සේ අනෝමදස්සී, පදුම, නාරද යන බුදුවරයන් වහන්සේ ලා තුන් නම එක කල්පයක පහළ වුනා. නාරද බුදු රජාණන් වහන්සේගෙන් පසුවත් මහා කල්ප අසංඛ්‍යයක් බුදුරජාණන් වහන්සේලා නැතිව ගෙවුනා. ඊළඟට පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ලොව පහළ වුනා. පදුමුත්තර සර්වඥයන් වහන්සේගේ සිට මේ කල්ප ලක්ෂය ඇතුළත අපේ මේ ගෞතම බුද්ධ ශාසනය



දක්වා බුදුරජාණන් වහන්සේලා 16 ක් තමයි පහළ වුනේ. මේ තරම් දුර්ලභයි බුද්ධෝත්පාද කාලය.

පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ ආයු කාලය වර්ෂ ලක්ෂයයි. එතැන් සිට මහා කල්ප හැත්තා දහසක් බුදුවරු පහළ නොවී, මීට කල්ප තිස් දහසකට උඩදී සුමේධ, සුජාත බුදුරජාණන් වහන්සේලා එකම කල්පයකදී පහළ වුණා. සුමේධ බුදුරජාණන් වහන්සේගේත් සුජාත බුදු රජාණන් වහන්සේගේත් ආයු කාලය වසර අනු දහසයි.

සුජාත බුදුරජාණන් වහන්සේගෙන් පසු මහා කල්ප විසි අට දහස් දෙසියයක් ගත වී මෙයින් කල්ප එක්දහස් අට සියයකට ඉහත දී පියදසසි, අතථදසසි, ධමමදසසි නම් වූ බුදුරජාණන් වහන්සේලා තුන් නමක් එකම කල්පයක ලොව පහළ වුනා. පියදසසි බුදු රජාණන් වහන්සේගේ ආයුකාලය වර්ෂ අනුදාහයි. අතථදසසි, ධමමදසසි සර්වඥයන් වහන්සේලා දෙනමගේ ආයු කාලය වර්ෂ ලක්ෂය බැගින් පැවතුනා.



ධම්මදසසි බුදුරජානන් වහන්සේගෙන් පසු මහාකල්ප එක් දහස් සත්සිය සයකට පසු මීට මහා කල්ප අනුහතරකට උඩදී සිද්ධත්ථ බුදු රජාණන් වහන්සේ ලොව පහළ වුනා. ආයුෂ් ප්‍රමාණය වර්ෂ ලක්ෂයයි. එයින් මහා කල්ප දෙකකට පසු මීට මහා කල්ප අනුදෙකකට ඉහත දී තිස්ස-ඵුසස නම් වූ සර්වඥයන් වහන්සේලා දෙනමක් එකම කල්පයේදී පහළ වුනා. එයින් තිස්ස බුදුරජාණන් වහන්සේගේ ආයුෂ් ප්‍රමාණය වර්ෂ ලක්ෂයයි. ඵුස්ස බුදුරජාණන් වහන්සේගේ ආයුෂ් ප්‍රමාණය වර්ෂ අනුදාහයි.

ඵුස්ස බුදුරජාණන් වහන්සේගෙන් පසු එක් කල්පයක් ගත වී මෙයින් මහා කල්ප අනු එකකට ඉහත දී විපස්සී බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ සේක. උන් වහන්සේගේ ආයුෂ ප්‍රමාණය වර්ෂ අසූ දහසක්. එතැන් සිට මහාකල්ප හැටකින් පසු මීට තිස්කල්පයකට ඉහත දී, සිඛී, වෙස්සභූ නම් සර්වඥයන් වහන්සේලා දෙනම එකම කල්පයක පහළ වූ සේක. සිඛී සර්වඥයන් වහන්සේගේ ආයුෂ් ප්‍රමාණය වර්ෂ හැත්තෑදහසයි.

වෙස්සභූ බුදුරජාණන් වහන්සේගේ ආයුෂ් ප්‍රමාණය වර්ෂ හැටදහසයි.

ඉන් අනතුරුව මහා කල්ප තිහක්ම බුදුරජාණන් වහන්සේලා නැතුව හිස්ව ගෙවුණා. ඉන්පසු මේ මහා භද්‍රකල්පයේදී කකුසඳ කෝනාගමන, කාශ්‍යප ගෞතම නමින් සර්වඥයන් වහන්සේලා සිවු නමක් පහළ වී වදාළා. මෛත්‍රී සර්වඥයන් වහන්සේද මේ කල්පයේදීම ලොව පහළ වෙනවා.

කකුසඳ බුදුරජාණන් වහන්සේගේ ආයුෂ් ප්‍රමාණය වර්ෂ සතලිස් දහසකි. කෝණාගමන බුදුරජාණන් වහන්සේගේ ආයුෂ කාලය වර්ෂ තිස් දහසක. කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ආයු කාලය වර්ෂ විසිදහසයි. ගෞතම සර්වඥයන් වහන්සේගේ ආයු කාලය වර්ෂ සියයයි. මතු බුදුවෙන මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ වර්ෂ අසූ දහසක් වෙනවා.

මේ වැනි බුද්ධෝත්පාද කාලයක් ලැබෙන විට මුළු ලෝකයටම පුදුමාකාර සෙතක් ශාන්තියක් සැලසෙනවා. යම් දවසක ලොව්තුරා බුදුවීම සඳහා නියත විවරණ ලැබෙනවා නම් එදාටත් දස දහසක්



සක්වළ ලෝක ධාතුවල ප්‍රාතිහාර්ය සිද්ධ වෙනවා. යම් දවසක පශ්චිම භවයේදී බෝසතාණන් වහන්සේ නමක් මව්කුසක පටිසන්ධි ගන්නවා නම් ඒ දවසේත් දස දහසක් සක්වළ ලෝක ධාතුවල ප්‍රාතිහාර්යන් සිද්ධ වෙනවා. යම් දවසක උපදින සේක් නම් ඒ දවසෙත් දස දහසක් සක්වළ ප්‍රාතිහාර්යන් සිද්ධ වෙනවා.

යම් දවසක බෝ මුල අරා වැඩ ඉඳ ගෙන මාර පරාජය කර ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයට පත්වන සේක් නම් ඒ දවසේදීත් දස දහසක් සක්වළ ලෝක ධාතුවල ප්‍රාතිහාර්ය සිද්ධ වෙනවා.

යම් දවසක සර්වඥයන් වහන්සේ විසින් දස දහසක් ලෝක ධාතුවට එක හඬින් ඇසෙන සේ දම්සක් පැවතුම් දේශණය පවත්වන සේක් නම් එදාටත් මහා පෘථිවියේ පටන් දස දහසක් සක්වළෙහි ප්‍රාතිහාර්යන් සිද්ධ වෙනවා.

යම් දවසක බුද්ධ පරිනිර්වාණය සිද්ධ වෙනවා නම් ඒ දවසේත් ඒ මංගල්‍ය ධර්මයන් සිද්ධ වෙනවා.

ඒ ප්‍රාතිහාර්යන් අතරට නරකාදියේ ගිණි නිවෙනවා. ප්‍රේත අපායේ සා පිපාසා දුක් ගිණි



නිවෙනවා. තිරිසන් අපායේ බිය තැති ගැනීම් දුරු වෙනවා. උපතින්ම ඇස් නැති අයට ඇස් පහළ වෙනවා. කන් ඇහෙන්නේ නැති බිහිරන්ට කන් ඇහෙනවා. ගොළුවන්ට කථා කළ හැකි වෙනවා. අංග විකල අයට අඟ පසඟ නිසි සේ පහළ වෙනවා. නිත්‍ය වෛරී සත්වයන් ඔවුනොවුන් සාමාග්‍රීව පිහිටවනවා. ඒ වෙලාවේ මේ දස දහසක් සක්වළ ලෝක ධාතුවේ කිසිම සතෙක් උපදින්නේ නැති තත්වයට එනවා. ඒ වෙලාවේ යම් දස දහසක් සක්වළ ලෝක ධාතුවේ කිසිම සතෙක් මරණයට පත්වෙන්නේ නැහැ. මහා සාගරයේ ජලය මිරිදිය වෙනවා. මිරිදිය වෙලා පස් පියුම් පිපෙනවා. ගංගා ජලය නැවතී පස් පියුම් පිපෙනවා. අහසේත් පොළවේත් සෑම තැනකම පියුම් පැන නගිනවා. තුරුලිය මුල පටන් අග දක්වා මලින් පිරී යනවා. තූර්ය භාණ්ඩයන් තිබු තැනම නාද වෙනවා. පියාසර කරන පක්ෂීන් බිමට බැහැලා නාද කරනවා. අශ්වයන් හේෂාරව කරනවා. ඇතුන් කුංචනාද කරනවා. මිනිස්සු පැළඳි ආභරණ ඉබේම දිලිසෙනවා. මහපොළවේ තැනින් තැන ජල උල්පත් මතු වෙනවා. මේ ආදී



අනේකවිධ ප්‍රාතිහාර්යන් සිද්ධ වෙනවා. දස දහසක් සක්වළ ලෝක ධාතුවල ඒ සියල්ලටම හේතු වුනේ බුද්ධෝත්පාද කාලයයි.

ඊළඟට සර්වඥයන් වහන්සේ දේශණා කරන ලද ශ්‍රී සද්ධර්මය නිසා කවදාවකවත් මනුෂ්‍යයන්ට අහන්න නැති සතිපට්ඨාන සතරක් පහළ වෙනවා. සම්‍යක් ප්‍රදාන් වීර්ය සතර පහළ වෙනවා. ඍද්ධිපාද සතර පහළ වෙනවා. ඉන්ද්‍රිය ධර්මතා පහ පහළ වෙනවා. බලධර්ම පහ පහළ වෙනවා. ලැබෙනවා. බොජ්ඣංග සත පහළ වෙනවා. ආර්ය අෂ්ඨාංගික මාර්ගය පහළ වෙනවා. නාම රූපයන් අවබෝධ වෙනවා. පංච උපාදනස්කන්ධය අවබෝධ වෙනවා. දොළොස් ආයතනත් අවබෝධ වෙනවා. අටළොස් ධාතුන් අවබෝධ වෙනවා. ජීවිත ඉන්ද්‍රියන් අවබෝධ වෙනවා. ද්වාදසාංග පටිච්ච සමුප්පාදය අවබෝධ වෙනවා. ඒ වගේම සුවිසි පට්ඨාන ධර්මයන් අවබෝධ වෙනවා. ලොව කවදාවකත් නොලැබුණු සෝවාන් මාර්ග ඵලය පහළ වෙනවා. සකදාගාමී මාර්ග ඵලය පහළ වෙනවා. අනාගාමී මාර්ග ඵලය පහළ වෙනවා. අරහත් මාර්ග ඵලය

පහළ වෙනවා. ත්‍රිවිද්‍යා ඥාණ ලොවට පහළ වෙනවා. ෂට් අභිඤ්ඤා ධර්ම ලොවට පහළ වෙනවා. චතුපටිසම්භිදා ඥාණ ලොවට පහළ වෙනවා. චුද්දස බුද්ධ ඥාණ ලොවට පහළ වෙනවා. සෝලස මහා ඥාණ ලෝකයට පහළ වෙනවා. තෙසැත්තෑ ඥාණ ලොවට පහළ වෙනවා. සත් සැත්තෑ ඥාණ ලොවට පහළ වෙනවා. මේ ආදී අසීමිත ධර්ම ස්වභාවය ලොවට පහළ වෙන්නේ සම්මා සම්බුදු රාජාණන් වහන්සේ කෙනෙකුගේ පහළ වීමෙන් පමණයි.

ඒ වගේම නරකාදී සතුන් සුගතියට එනවා. සුගතියේ සතුන් දෙව් ලොවට බඹ ලොවට යනවා. ඒ වගේම මනුලොව දෙව්ලොව බඹලොව අනන්ත පිරිසක් සෝවාන් ආදී මාර්ගඵල අවබෝධයෙන් චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් ජාති ජරා ව්‍යාධි මරණ ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසාදී සංසාර දුකෙන් අත මිදිලා අජාති අජර අව්‍යාධි අශෝක අනුපායාස අමාමහ නිවනට පත් වෙනවා. ඒ නිසා මේ බුද්ධෝත්පාද කාලය ලොවට සෙතක් ශාන්තියක් සම්පත්තියක්. ඒ ධර්ම ස්වභාවය ලොවට පහදා දීම ලොවට සෙතක්



ශාන්තියක්. ඒ ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි යෙදෙන මහා සංඝරත්නය සාමාග්‍රීතාවයට පත්වීම ලොවට සෙතක් ශාන්තියක්. ඒ වගේම ගිහි පැවදි බෞද්ධ ජනතාව ඔවුනොවුන් කරුණාවෙන් මෛත්‍රියෙන් ශ්‍රද්ධාවෙන් ශීලයෙන් ගුණයෙන් ත්‍යාගයෙන් ඥාණයෙන් සාමාග්‍රීධර්මයේ පිහිටීම දෙවියන් සහිත ලෝකයාට සෙතක් ශාන්තියක් පිණිස පවතිනවා.

මෙවැනි සම්බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍ය ජීවිතයක් ලබා ගැනීමට වාසනාවන්ත වුනා නම් ඒ වාසනාවට කියනවා ක්ෂණ සම්පත්තිය කියලා. මේ ක්ෂණ සම්පත්තිය ලබාගත් ගිහි පැවිදි පිංවතුන් අප්‍රමාදව චතුරාර්ය සත්‍ය අවබෝධය සඳහා හේතු වන දාන, ශීල, භාවනා ආදී කුසල් ධර්මයන් රැස්කර ගන්නවා නම් ඊට වඩා සම්පත්තියක් වෙන රැස්කර ගන්න ලොව ඇත්තේ නැහැ. මේ ලෝක ධාතුවේ දීර්ඝ සංසාරයෙහි අහස දෙස බැලුවාම රන් කහවණු වැසි වස්සන ඍද්ධි ප්‍රාතිහාර්ය පෙර ජාතිවල අපිට ලැබිලා තිබුණා. චක්‍රවර්තී රාජ්‍ය, සක්දෙව් රාජ්‍ය ලැබිලා තිබුණා. බ්‍රහ්ම රාජ සම්පත් අපට ලැබිලා තිබුණා. ඒ



වගේම බ්‍රහ්ම ලෝකවල අරූප ලෝකවල අනන්ත අප්‍රමාණ වාරවල අප ඉපදිලා තිබුණා. සතර අපායේ අප අනන්ත වාර වල ගොස් තිබුණා. මේ සංසාර ගමනේ ඉමක් කොනක් නිමාවක් නැති නිසා මේ ජාති ජරා ආදී සංසාර දුකෙන් එතෙර වී ලැබෙන සතර මාර්ග ඵල නිවන සාක්ෂාත් කරගැනීමට හේතුවන බුද්ධෝත්පාද කාලයකදී සම්මා දිට්ඨික මනුෂ්‍ය ජීවිතයක් පතිරූප දේස වාස දේශයක පූර්වේකත පුඤ්ඤතාව ඇතිව ආත්ම සම්මා පණිධිය ඇතිව පවත්වා ගන්න ලැබීම තරම් ක්ෂණ සම්පත්තියක් භාග්‍යයක් වෙන ඇත්තේ නැහැ.

මේ භාග්‍ය සම්පත්තිය උදාකර ගැනීමෙන් තමන්ගේ නිවන් මඟ ආලෝකමත් කරමින් යන මේ ගමනට තවදුරටත් රතනත්‍රයේ ආශිර්වාදය ලැබෙන උතුම් පිංකමක් ධාර්මිකව මුදුන් පමුණුවා ගත්තා කියලා දැන් සතුටු වෙන්න පුළුවන්.

මෙතැනින් මේ රැස්කරගත් නිර්වාණගාමී කුසල සම්භාර ධර්මය හිතවත් මැදහත් අහිතවත් සෑම



සත්වයන්ටත් මෙම කොළඹ අගනුවර සිට අවට ගම් නගර ලංකාව දඹදිව මේ සක්වළ සියලු සක්වළ දස දිශාව වාසී සමස්ත ලෝක සත්වයාට ලැබේවා.

සියලු සත්වයන් නිදුක් වෙත්ව. නීරෝගී වෙත්වා. සුවපත් වෙත්වා. තෙරුවන් සරණ යෙත්වා. නිවන් මඟ ගමන් කෙරෙත්වා චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් නිවන් සුව ලබත්වා කියලා මෛත්‍රියෙන් පිං පමුණුවමු.